**පේදුරුතුඩුව නගර සභාව - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පේදුරුතුඩුව නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා අරමුදලින් නාච්චිමාර් කෝවිල පාරේ ඉතුරු කොටස අළුත්වැඩියා කිරීම සඳහා වැයවූ රු. 116,012 ක මුදල ඉඩම් හා ගොඩනැගිලි ගිණුම යටතේ ගිණුම්ගත කර තිබීමෙන් රු. 116,012 වටිනාකමින් ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීම වැඩියෙන් දක්වා තිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාල වියදම වැරදීමකින් ඉඩම් සහ ගොඩනැගිලි ගිණුමට ඇතුළත් කර ඇත. ජර්නල් සටහන් මගින් නිවැරදි කර ඇත. 2022 වර්ෂයේ ගිණුම්වල දැක්වීමට කටයුතු කරමි. | අදාල වැරද්ද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු ඉඩම් කැබැලි 06 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීමෙන් ජංගම නොවන වත්කම්වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | සභාව සතු ඉඩම් 06 ක වටිනාකම තක්සේරු කර තිබුණද, එම ඉඩම්වල ඔප්පු සහ ලියවිලි නොමැති බැවින් වත්කම් ගිණුම යටතේ ගිණුම්ගත නොකළෙමි. අදාල ඉඩම් ඔප්පු ලැබීමෙන් පසු වත්කම් ගිණුමේ සටහන් කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ. | ගිණුම් කරණ ප්‍රතිපත්ති අනුව අදාල කටයුතු නිමකර ඇති බව සනාථ කර සටහන් කළ බව සනාථ කළ යුතු අතර අදාල අඩුපාඩු නිවැරදි කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් ව්‍යාපෘති 04 ක් , වාහන අළුත්වැඩියා 02 ක් ක්‍රියාත්මක කර නොතිබුණද, සභා ලේකම්ගේ නමින් ගෙවීම් වවුචර පිළියෙල කර විවිධ ණය හිමියන් යටතේ දක්වා තිබීමෙන් වියදම් සහ ජංගම වගකීම රු. 6,035,326 වැඩියෙන්ද දක්වා තිබුණි. | විවිධ ණය හිමියන් යටතේ වෙන්කරන ලද ව්‍යාපෘති 04 කට අදාලව ගෙවීම් වවුචර් ලැබී නොතිබූ හෙයින් විවිධ ණය හිමියන් යටතේ වෙන්කරන ලදී. දැනට මෙම ව්‍යාපෘතිය සඳහා ගෙවීම් සිදු කර ඇත. වාහන අළුත්වැඩියාවන් නිමකර ගෙවීම් සිදුකර ඇත. | ගිණුම් කරණ ප්‍රතිපත්ති අනුව අදාල කටයුතු නිමකර ඇති බව සනාථ කර ගෙවීම් කළ බව සනාථ කළ යුතු අතර අදාල අඩුපාඩු නිවැරදි කළ යුතුය. |
| (ඈ) | නගර සභා ආඥා පනතේ 157 වගන්තියේ උප වගන්ති 7(ඊ) අනුව සහ බලප්‍රදේශයේ සවි කර තිබූ දැන්වීම් පුවරු වලින් බලපත්‍ර ගාස්තු අයකළ යුතුවූවද, සවිකර තිබූ දැන්වීම් පුවරු 15 ක් සඳහා ගාස්තු අයකර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු. 49,725 ක් වටිනාකමින් ආදායම් අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි. | දැන්වීම් පුවරු 15 ක ගාස්තු අයකර ගැනීම සඳහා අදාල කඩ හිමියන් වෙත ලිපි යවා අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | ආදායම් රැස්කිරීමේ කළමනාකරණය ඵලදායීව සිදු කර හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවූ අවස්ථාවන් පහත දැක්වේ.

| | රීති ,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | වර්ෂ 02 ක් ඉක්මවූ රු. 604,609 ක කල් ඉකුත්වූ විවිධ තැන්පත් හා කොන්ත්‍රාත් තැන්පත් සම්බන්ධයෙන් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු කරමින් පවති. | මුදල් රෙගුලාසි අනුව කඩිනමින් කටයුතු කළ යුතුය. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,053,271 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 41,959,620 ක් විය.

## 2.2 ආදායම් පරිපාලන

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීම් කාර්යසාධන පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම්**<br>නගර සභා ආඥා පනතේ අධිකාරය 255 වගන්තිය 160(1) අනුව නගර සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි වෙනුවෙන් අයකළ යුතු රු. 1,625,742 ක් වටිනා හිඟ වරිපනම්, වර්ෂ 02 කට වඩා වැඩි කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නැති බව නිරීක්ෂණ විය. | සභාව විසින් 2022.01.23 දින සිට 2022.01.31 දක්වා පවත්වන ලද ජංගම සේවය මගින් සහ බේරුම්කිරීමේ නිලධාරීන් විසින් 2022.05.31 දිනය දක්වා හිඟ මුදලින් රු. 2,797,084 ක් අයකර ඇත. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ආ) **කුලී**

-----

| | | |
|---|---|---|
| සභාව විසින් දීර්ඝ කාලීනව බදු දී තිබූ දේපළ සම්බන්ධයෙන් කඩකාමර 61 ක ගිවිසුම් අවුරුදු 05 කට හෝ 03 කට වරක් අළුත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. තවද, වසර 5ක් ඉක්මවූ රු. 706,149 ක බදු කුලී හිඟයක්ද පැවතුනි. | ගිවිසුම් අළුත්කිරීම සඳහා කඩකාමර 13 ක හිමිකරුවන් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කර ඇත. අනිකුත් කඩකාමරවල බදු ගිවිසුම් අළුත් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවති. සභා ඉඩම් හිඟ බදු මුදලින් රු. 13,900 ක් අයකර ගෙන ඇත. වෙළඳ සංකීර්ණයේ කඩකාමර වලින් රු. 236,191.81 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි මුදලවන රු. 316,358.72 ක් කෝවිඩ් 19 කාල පරිච්ඡේදයේ වසා තිබූ කාලයට අදාල ඒවාය. එම මුදල කපා හැරීම සඳහා ගරු. ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | ගිවිසුම් අදාල කාල පරිච්ඡේදයතුල අළුත් කිරීමට කටයුතු කළ යුතු අතර, අදාල හිඟ මුදල් සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු නව වෙළඳ සංකීර්ණයේ 07 වන මහලේ කඩ කාමර 2013 වර්ෂයේ ඉදිකර නිමකර තිබුණද, මේ දක්වා එය බදු දීමට කටයුතු නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ රු. 260,000 කින් ආදායම් අහිමිවී තිබුණි. | අදාල කඩ කාමර වානිජ කටයුතු සඳහා බදු දීමටත් ඒ සඳහා එක් වර්ෂයක අත්තිකාරම් ලබා ගෙන බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවීම සඳහා 2022.05.13 දින පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය සඳහා යවා ඇත. | සභාවේ ආදායම් මාර්ග සම්පූර්ණයෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රු. 121,451,369 ක් වටිනා ස්ථාවර තැන්පත් මුදල සභාවේ සංවර්ධන කටයුතු සඳහා යොදවා නොගෙන පොලී ආදායම් ඉපයීම සඳහා බැංකුවේ තැන්පත් කර තිබුණි. | ස්ථාවර තැන්පත්වලින් ලැබෙන පොලි ආදායම සභාවේ අයවැයට ඇතුළත් කර සංවර්ධන කටයුතු සඳහා යොදවා ගනු ලැබේ. අරමුණ ගත කාර්ය සඳහා මෙම ස්ථාවර තැන්පත් යොදවාගනු ලැබේ. | සභා අරමුදල උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ භෞතිකව නොපවතින උපකරණ ලේඛනයේ සටහන් කර තිබූ රු. 4,160,000 ක් වටිනා Vibration Roller ලෙහි වටිනාකම පොත්වලින් ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි. | Vibration Roller - රු.103,000 ක් සහ Road Roller - රු. 1,114,769 ක් වත්කම්වල වටිනාකම පොත්වලින් කපාහැරීම සඳහා අදාල පරීක්ෂණ වාර්තාවේ පිටපත සහ වෙනත් ලියවිලිවල පිටපත් සමඟ ගරු. ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා දෙන ලෙස 2022.03.17 දින උතුරු පළාත් පාලන කොමසාරිස්ට යවා ඇත. | මෙම කරුණු සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාකළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක ණය** | | |
| සමාලෝචිත වර්ෂයේ වැඩ තහනම් කර සහ විශ්‍රාමික නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 212,890 ක් වටිනා ආපදා ණය සහ විශේෂ ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සි. සිවලින්ගම් මහතාගෙන් අයවියයුතු මුදල වන රු.95,740 ක් මරණ පාරිතෝෂික මුදලින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් ලබා ගැනීමට කටයුතු කර ඇත. එස්. සුරේෂ් කුමාර් මහතා ගෙන් අයවිය යුතු උත්සව අත්තිකාරම් දැනට අයකර ඇත. | හිඟ ණය ශේෂය අදාල කාල පරිච්ඡේදයතුල අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**3.4 වාහන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු Compactor, Gully Bowser බදු දීමෙන් ආදායමක් උපයා ගත හැකිවූවද, සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මේ සම්බන්ධයෙන් කටයුතු කර නැත. | Gully Bowser සේවයේ යොදවා අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නගර සභාවට සුදුසු ස්ථානයක් නොමැති බැවින් එම සේවාව අත්හිටුවා ඇත. Compactor යෙදවීමට කාර්යයන් ඉතා අඩුවෙන් දක්නට ලැබේ. | මෙම කරුණු සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාකළ යුතුය. |